Prepared by- එච්.ටී.ඩී.ජයවර්ධන

කලාප අධ්‍යාපන කාර්යාලය - ඇඹිලිපිටිය

ඇමුණුම 7.4.1.2

## කියවීම් පත්‍රිකාව

**දේශීය සාම්ප්‍රදායික සත්ත්ව රූප හා ඒවායේ භාවිතය -**

- හංසයා - සාම්ප්‍රදායික බිතු සිතුවම්, ලී කැටයම්, ගල් කැටයම්, ඇත් දත් කැටයම්, රන්, රිදී, පිත්තල භාණ්ඩ සහ ආභරණ, පුස්කොළ පොත් කම්බ, වඩිම්බු උළු කැට
- හංස පූට්ටුව - සාම්ප්‍රදායික බිතු සිතුවම්, ලී කැටයම්, ඇත් දත් කැටයම්, රන්, රිදී, පිත්තල භාණ්ඩ සහ ආභරණ, පුස්කොළ පොත් කම්බ
- සිවු හංස පූට්ටුව - සාම්ප්‍රදායික බිතු සිතුවම් (මහනුවර දළදා මාළිගාවේ පල්ලේ මාලයේ සිවිලිම් චිත්‍ර)
- සිංහයා - සාම්ප්‍රදායික බිතු සිතුවම්, ලී කැටයම්, ගල් කැටයම්, වඩිම්බු උළුකැට, රන්, රිදී සහ පිත්තල භාණ්ඩ
- ඇතා, අශ්වයා, ගවයා, ගිරවා, මොනරා, නාගයා සාම්ප්‍රදායික බිතු සිතුවම්, ගල් කැටයම්, ලී කැටයම් සහ පිත්තල ආදි
- යාලි ලී කැටයම්, ගල් කැටයම්
- ඇත්කඳ ලිහිණියා, භේරුණ්ඩ පක්ෂියා, ගජසිංහ, සරපෙන්දියා -සාම්ප්‍රදායික බිතු සිතුවම්, ලී කැටයම්, ගල් කැටයම් සහ පිත්තල භාණ්ඩ ආදි

**සත්ත්ව රූප සැරසිලි ඒකකවල දැකිය හැකි විශේෂ ලක්ෂණ**

- සෑම සත්ත්ව රූප සැරසිලි ඒකකයක් ම ස්වාභාවික සත්ත්ව රූප එකක් හෝ කිහිපයක් හෝ යොදා ගෙන ශෛලිගත ආකාරයට මෝස්තරානුකූල ව නිර්මාණය කොට තිබීම.
- යොදාගනු ලබන මාධ්‍යයට හා කලා කෘතියේ ස්වභාවයට සහ තලයට උචිත ආකාරයට රූපය සම්පිණ්ඩනය කර තිබීම.

**සත්ත්ව රූප සැරසිලි සුලබ ව දැකිය හැකි ස්ථාන**

- **ලී කැටයම්** - ඇම්බැක්ක දේවාලය, හින්දු කෝවිල්
- **බිතු සිතුවම්** - මහනුවර දළදා මාළිගාව, හින්දු කොවිල්
- **රන්, රිදී සහ පිත්තල කැටයම්** - මහනුවර සහ කොළඹ ජාතික කෞතුකාගාරය ආදී ස්ථාන
- **පුස්කොළ පොත් කම්බ සිතුවම්** - කොළඹ ජාතික කෞතුකාගාරය ආදී ස්ථාන



හංසයා



හංස පූට්ටුව



සිවු හංස පූට්ටුව



සිංහයා



සිංහම



ගවයා



අශ්වයා



ඇතා



ගිරවා



මොනරා



නාගයා



යාලි



ගජසිංහ



ඇත්කඳ ලිහිණියා



සරපෙන්දියා



හේරුණ්ඩ පක්ෂියා

67

පැවරුම

1. සාම්ප්‍රදායික සත්තව රූප එකතු කර පොතක් සකසන්න